**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙහි**
**අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි**
**තාක්ෂණ නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය**

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

යොමු අංකය : සිපිසි/සිඑස්/11/1/1/57(2) දිනය: 2017.04.04

1.2 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශය

යොමු අංකය : CPC/CMS/1/3/Cadre දිනය: 2017.05.02

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය : DMS/D/පොදු/11 -2 දිනය: 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය

යොමු අංකය : CPC/CS/2/3/SM/C (VI) දිනය: 2017.07.10

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය : NPC/10/71/2/SR දිනය: 2022.02.15

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය

යොමු අංකය : CPC/PSC/18-A/TO/01 දිනය: 2022.03.02

1.7 ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය

යොමු අංකය : දිනය:

**02.** පත්කිරීම් බලධරයා : මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරවරයා විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික

3.2 තනතුරු නාමය : තාක්ෂණ නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක)

3.3 ශ්‍රේණි : III , II හා I

3.4 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

මධ්‍යම පළාත් සභාව තුළ ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරෙන ඉංජිනේරු ක්ෂේත්‍රයේ මධ්‍යම හා විශාල ප්‍රමාණ ව්‍යාපෘතීන්හි වාස්තු විද්‍යාත්මක ව්‍යුහ ඉංජිනේරුමය සැලසුම්වලට අනුකූලව සම්මත ප්‍රමිති මිණුම් භාවිත කොට මිණුම් පත්‍ර හා ප්‍රමාණ පත්‍ර සැකසීම, බිල්පත්වල ප්‍රමාණයන් පරීක්ෂා කිරීම හා ප්‍රමාණ සහතික කිරීම, මිල විශ්ලේෂණ සකස් කිරීම, ප්‍රසම්පාදන ලියකියවිලි සකස් කිරීම හා වැඩ ඇගයීම මගින් අරමුදල් උපරිම කාර්යක්ෂම අයුරින් භාවිත කිරීමට කටයුතු කිරීම.

ප්‍රවර්තන තක්සේරු ශිල්ප ක්‍රම යොදා ගැනීම මගින් ඵලදායි ලෙස අරමුදල් භාවිත කිරීම හා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ඵලදායි මූල්‍ය කළමනාකරණය සඳහා සහාය වීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022-03-22 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

3.5 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජොෂ්ඨත්වය හා කුසලතාව මත පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

**04.** තනතුරේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය

**05.** වැටුප් :

5.1 වැටුප් කේත අංක : MN 03 -2016

5.2 වැටුප් පරිමාණය : 31,040-10 x 445-11 x 660-10 x 730-10 x 750-57,550/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය ( රු. ) |
|---|---|---|
| III | 01 | 31,040/- |
| II | 12 | 36,150/- |
| I | 23 | 43,480/- |

5.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

**06.** සේවා ගණයට අයත් තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්:

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| තාක්ෂණ නිලධාරි ( ප්‍රමාණ සමීක්ෂක ) | III , II , I | 03 | සම්මත මිණුම් ක්‍රම අනුව වැඩ ඇස්තමේන්තු සකස් කිරීම, මිල ගණන් සකස් කිරීම, වැඩ බිම් පරිපාලනය, බිල් පත්‍ර සකස් කිරීම, බිම් මිණුම් ගැනීම හා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය අනුව කොන්ත්‍රාත් පිරිනැමීම |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 03යි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යයන් සඳහා III, II, I ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැළකේ.

**07.** බඳවා ගැනීමේ ක්‍රමය

7.1

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 70% |
| සීමිත | 30% |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022.03.22 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2. සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයයන් හය (06) කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය එකවර සමත්වීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) විභාගයේ භෞතික විද්‍යා විෂයය ධාරාවට අයත් සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උසස් ගණිතය යන විෂයයන් තුනකින් එකවර සමත් වීම හෝ තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් දෙක සහිතව විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර ( උසස් පෙළ ) විභාගය එකවර සමත්ව තිබීම.

( සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයය හැර )

7.2.2.2 වෘත්තීය සුදුසුකම්

රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා ( N.V.Q) (06) මට්ටමේ සුදුසුකම සම්පූර්ණ කර තිබීම

හෝ

උක්ත රැකියා ක්ෂේත්‍රයට අදාළව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ තාක්ෂණ සහතික නිකුත් කරනු ලබන අනෙකුත් ආයතනවලින් විමසා අදහස් ලබාගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4. කායික සුදුසුකම්

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් සෑම අයුරකින්ම ශාරීරික හා මානසික යෝග්‍ය විය යුතුය.

7.2.2.5 වෙනත් :

I. අයැදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
II. අයැදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය
III. අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට පූර්වාසන්නයෙන්ම වූ වසර 03 ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

...රු ආණ්ඩුකාරතුමා විසින්
2022-03-22 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

IV. තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව : වයස අවු. 18ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව : වයස අවු. 30 ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : ලිඛිත පරීක්ෂණයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% | ඇමුණුම 01 |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% | |

7.2.4.1.1 පවත්වන බලධාරියා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ( ලකුණු ලබාදෙනු නොලැබේ. )
ඉටුකරගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5 අයැදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල හා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022 - 03 - 22 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**7.3 සීමිත බඳවාගැනීම**

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව , විද්‍යාව , ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය විෂයයන් හය ( 06 )කින් සමත්වීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම් තනතුරට අදාළව 7.2.2.2 හි සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා තිබිය යුතුය.

7.3.2.3 පළපුරුද්ද

ප්‍රාථමික හෝ ඉන් ඉහළ සේවා ගණයක ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

7.3.2.4 කායික සුදුසුකම්

මධ්‍යම පළාත් සභාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත්

I. පත්වීම ස්ථිර කර තිබිය යුතුය.

II. නියමිත දිනට පූර්වාසන්නව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර දෙපාර්තමේන්තුගත තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු අතර, ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

III. සේවයට බඳවාගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ නිලධාරියා සියලු සුදුසුකම් අයැදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7.3.3 වයස

අදාළ නොවේ.

7.3.4 බඳවාගැනීමේ ක්‍රමය

ලිඛිත තරඟ විභාගයක් සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයැදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ.

7.3.4.1 ලිඛිත විභාගය

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය | විෂය නිර්දේශය |
|---|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% | ඇමුණුම 01 |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% | |

7.3.4.1.1 පවත්වන බලධාරියා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : ලකුණු ලබාදෙනු නොලැබේ.

7.3.4.3.1 ඉටු කරගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම

ගරු ආණ්ඩුකාරතුමා විසින් ...2022-03-22 දින අනුමත කරන ලදී. ආණ්ඩුකාර ලේකම්

7.3.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.3.4.5 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත්වල හා වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මඟින්

**08.** කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවාගෙන වසර 03 ගතවීමට ප්‍රථම | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස්වී වසර 03 ගතවීමට ප්‍රථම | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස්වී වසර 05 ගතවීමට ප්‍රථම | කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව (ඇමුණුම 04) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන බලධරයා

8.3.1. පළමු හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබයි

8.3.2. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නම් කරනු ලබන ආයතනයක් විසින් නම් කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි

**09.** රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධාරියෙකු විසින් පරිවාස කාලය තුළ එක් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබාගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය ලබාගත යුතුය. |
| සන්ධාන භාෂාව | ඉංග්‍රීසි භාෂාව පිළිබඳව අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් III ශ්‍රේණියේ සිට වසර 05 ක් ඉක්මවීමට පෙර ලබාගත යුතුය. |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 22 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 III වන ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම (සාමාන්‍ය මට්ටමේ කාර්යය සාධනය අනුව)

#### 10.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

- පත්වීම ස්ථිර කර තිබීම
- නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක ( 10 ) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහය ( 10 ) ක් උපයාගෙන තිබීම.
- අනුමත කාර්යය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය ( 10 ) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යය සාධනයක් පෙන්නුම් කර තිබීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන් අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
- පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.
- අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගෙන තිබීම.

#### 10.1.2 උසස් කිරීමේ ක්‍රමය

- සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත ඉල්ලුම් කරනු ලබන විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි තනතුරේ II ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

### 10.2 II වන ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම (සාමාන්‍ය මට්ටමේ කාර්යය සාධනය අනුව)

#### 10.2.1 සපුරාලිය යුතු සුදුසුකම්

- සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම
- අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක ( 10 ) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන් අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
- නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

### 10.3 උසස් කිරීමේ ක්‍රමය

- සුදුසුකම් සම්පූර්ණ කරන සේවකයින් විසින් නියමිත ආකෘති පත්‍රය මගින් පත්වීම් බලධාරියා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පත්වීම් බලධාරියා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව I ශ්‍රේණියට උසස් කිරීම සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි පත්වීම් බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022.03.22 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

සටහන:

සාමාන්‍ය මට්ටමේ කාර්යසාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම් සමත්වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

**11.** තනතුරුවලට පත්කිරීම : අවශ්‍යතාවය පරිදි බඳවාගැනීමේ පරිපාටියට අනුකූලව පත් කරනු ලැබේ.

**12.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි

12.1 පරිවාස කාලය හා සේවය ස්ථිර කිරීම

I. විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III වන ශ්‍රේණියට බඳවාගන්නා ලද නිලධාරියෙකු වසර 03 පරිවාස කාලයකට යටත් වේ. ඔහු / ඇය පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත්ව සහ රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇත්නම් හා ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් ඔහු/ඇය පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

II. සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගන්නා ලද නිලධරයන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු / ඇය වැඩ බැලීමේ කාලය තුළ සිය රාජකාරි , වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් වැඩ බැලීමේ කාලය අවසානයේදී සේවයේ ස්ථිර කරනු ලැබේ.

**13.** නිර්වචන

13.1 “ බඳවාගැනීමේ පරිපාටිය “ යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ නිලධාරි ( ප්‍රමාණ සමීක්ෂක ) තනතුර සඳහා වන බඳවාගැනීමේ පරිපාටියයි.

13.2 “ගැසට් පත්‍රය” යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය වේ.

13.3 “ගරු ආණ්ඩුකාරතුමා / තුමිය” යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා වේ.

13.4 “කොමිෂන් සභාව” යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.5 “ලේකම්” යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වේ.

13.6 “අමාත්‍යාංශ ලේකම්” යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ඉංජිනේරු සේවා විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

13.7 “දෙපාර්තමේන්තු ප්‍රධානියා” යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයාය.

13.8 “සතුටුදායක සේවා කාලය” යනුවෙන් අදහස් කරනුයේ රජයේ නිලධාරියෙකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ නියමිත දිනට සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

රු ආණ්ඩුකාරතුමා විසින් 2022 - 03 - 22 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

13.9 "සක්‍රිය සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ රජයේ වුවමනාවන්ට හෝ / හා රජයේ ප්‍රතිපත්තිමය හේතුවලට යටත්ව ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් තමාට පැවරෙන රාජකාරියෙහි සත්‍ය වශයෙන්ම කරන ලද කාල සීමාව වේ.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි මධ්‍යම පළාත් සභා මූල්‍ය රීති සහ රජය / මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීති රීති හා / හෝ රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවාගැනීමේ පරිපාටියෙහි සඳහන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ පරිපාටියෙහි විධිවිධාන සළසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටළුවකදී මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයාගෙන් විමසා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය පරිදි තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 22 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**<u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ සේවා නිලධාරී ( ප්‍රමාණ සමීක්ෂක ) III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත / සීමිත තරග විභාගය</u>**

1. විභාගය පිළිබඳ විස්තර

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 03 | 100 | 40% |

2. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

3. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු පවතින අවස්ථාවලදී

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේශන තත්ත්වයත් තීරණ කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |
| විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | සම්මත මිනුම් ක්‍රම , වැඩ ඇස්තමේන්තු සකස් කිරීම , මිල ගණන් සකස් කිරීම , ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය , ප්‍රගති පාලන , වැඩබිම් මට්ටම් හා බිම් මිණුම් ගැනීම , වැඩ බිම් පරිපාලනය, බිල් පත්‍ර සකස් කිරීම, කොන්ත්‍රාත්කරුවන් සමග වන ආරවුල් සමනය කිරීම |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 22 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම්

**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ සේවා ( ප්‍රමාණ සමීක්ෂක ) III ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම**

1. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

2. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබයි

3. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට දෙවරක්

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති | • රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති<br>• ආයතන සංග්‍රහයේ<br>• VIII පරිච්ඡේදය- අතිකාල දීමනා, නිවාඩු දවස් සඳහා වැටුප් හා දීමනා<br>• XII පරිච්ඡේද - නිවාඩු<br>• XIII පරිච්ඡේද - දුම්රිය බල පත්‍ර<br>• XIV පරිච්ඡේද - දිවයින ඇතුළත රාජකාරී ගමන්<br>• XIX පරිච්ඡේද - රජයේ නිවාස |
| මුදල් රෙගුලාසි | • I වන පරිච්ඡේදය - වියදම් හා ආදායම් ඇස්තමේන්තු ( මු.රෙ. 1 සිට 68 දක්වා )<br>• iii වන පරිච්ඡේදය - මූල්‍ය කළමනාකරණය ( මු.රෙ. 124 සිට 147 දක්වා ) |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 22 දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 03

**<u>මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ සේවා ( ප්‍රමාණ සමීක්ෂක ) II ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම</u>**

1. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | පැය 02 | 100 | 40% |
| මුදල් රෙගුලාසි | පැය 02 | 100 | 40% |

2. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබයි

3. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : වර්ෂයකට දෙවරක්

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කාර්යාල පරිපාලනය හා ආයතන සංග්‍රහය | මෙම ප්‍රශ්න පත්‍රය ආයතන සංග්‍රහයේ පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br><br>XV වන පරිච්ඡේදය - අධ්‍යාපන අභ්‍යාස හෝ රාජකාරි කටයුතු සඳහා පිටරට යෑම<br>XVI වන පරිච්ඡේදය - නිවාඩු ගමන්<br>XXIII වන පරිච්ඡේදය - ඇතැම් වර්ගවල ලෙඩ රෝගවලින් පෙලෙන රජයේ නිලධාරින්ට විශේෂ අනුග්‍රහ සහ ඒ පිළිබඳ කොන්දේසි<br>XXIV වන පරිච්ඡේදය - වැටුප් ණය හා අත්තිකාරම්<br>XXV වන පරිච්ඡේදය - වෘත්තීය සංගම්වල සාමාජිකයින්ට අනුග්‍රහය<br>XXVII වන පරිච්ඡේදය - ලිපි ගනුදෙනු කිරීමේ මාර්ගය<br>XXVIII වන පරිච්ඡේදය - පරිපාලන කාර්ය පරිපාටි හා විධි<br>XXX වන පරිච්ඡේදය - රජයේ නිලධාරින් සම්බන්ධයෙන් ආණ්ඩුව සතු බලතල<br>XXXIII වන පරිච්ඡේදය - නීති උපදෙස් හා නීති ක්‍රියාමාර්ග<br>XLVII වන පරිච්ඡේදය - සාමාන්‍ය හැසිරීම හා විනය<br>XLVIII වන පරිච්ඡේදය - විනය කාර්ය පරිපාටි<br><br>නිලධාරින්ගේ කාර්ය සාධන ඇගයීම් පිළිබඳ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අදාළ වේ. |
| මුදල් රෙගුලාසි | මෙම ප්‍රශ්න පත්‍රය මුදල් රෙගුලාසිවල පහත සඳහන් පරිච්ඡේද මත සැකසේ.<br><br>VI වන පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදිය භාරකාරීත්වය , අග්‍රිමය හා බැංකු ගිණුම් රාජ්‍ය මූල්‍ය සුරක්ෂිතභාවය , සමීක්ෂණ මණ්ඩලය , අයිරාව , බැංකු ගිණුම් ( මු.රෙ. 315 සිට 396 දක්වා )<br>XII වන පරිච්ඡේදය - ( මු.රෙ. 685 සිට 775 දක්වා) |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 2[illegible] දින
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

**මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ සේවා ( ප්‍රමාණ සමීක්ෂක ) I ශ්‍රේණියේ නිලධාරින් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම**

1. විභාගය පිළිබඳ විස්තර : මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 40% |
| කළමනාකරණය | පැය 02 | 100 | 40% |

2. පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් නම් කරනු ලබන ආයතනයක් විසින් නම් කරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පාඨමාලාවකි

3. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග : අවශ්‍යතාව පරිදි වසරකට එක් වරක් පවත්වනු ලැබේ

4. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| තාක්ෂණ ප්‍රශ්න පත්‍රය | සම්මත මිණුම් ක්‍රම , වැඩ ඇස්තමේන්තු සකස් කිරීම, මිල ගණන් සකස් කිරීම, ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය, ප්‍රගති පාලන, වැඩබිම් මට්ටම් හා බිම් මිණුම් ගැනීම , වැඩ බිම් පරිපාලනය , බිල් පත්‍ර සකස් කිරීම , කොන්ත්‍රාත්කරුවන් සමඟ වන ආරවුල් සමනය කිරීම |
| කළමනාකරණය | 1. කළමනාකරණය මූලධර්ම<br>2. කළමනාකරණ ශ්‍රිතයන්<br>• සැලසුම් කිරීම<br>• තීරණ ගැනීම<br>• තීරණ ගැනීමේ ක්‍රියාවලිය<br>• සංවිධානය<br>• මාණ්ඩලිකරණය<br>• මෙහෙයවීම<br>• අභිප්‍රේරණ ක්‍රියාවලිය<br>• නායකත්වය<br>• පාලනය<br>• පාලනමය ප්‍රතිපත්ති ක්‍රියාවලිය<br>3. සහභාගිත්ව කළමනාකරණය<br>4. කළමනාකරණ පරිසරය<br>5. සිද්ධි අධ්‍යයනය |

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2022 - 03 - 22 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය -: නිර්දේශ කරමු

1. පී.ජී. අමරකෝන් මහතා (සභාපති) ..............................
2. ඩබ්ලිව්.එම්.එස්.ඩී. වීරකෝන් මහතා (සාමාජික) ..............................
3. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..............................
4. ඒ.එම්. වයිස් මහතා (සාමාජික) ..............................
5. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..............................
6. ජේ.ඩී.කේ. වික්‍රමරත්න මහතා (සාමාජික) ..............................
7. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ..............................

දිනය 2022.03.02

ආණ්ඩුකාර ලේකම්,

2022.03.02 .. දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2022/268 .. යටතේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2022.03.04 ..............................

ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

නිල මුද්‍රාව ටී.ජී.ඩී.ඩබ්ලිව්. ඥානානන්ද
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : අනුමත කරමි. / නොකරමි.

තිසිඟඳ ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත 2022-03-22